(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 65. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2025 ජූලි 08** අඟහරුවාදා **පූ.භා. 9.30** ට

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **(වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා,** කථානායකතුමා

ගරු **(වෛද්‍ය) රිස්වි සාලි මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **හේමාලි වීරසේකර මහත්මිය,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය

---

ගරු **ආචාර්ය හරිනි අමරසූරිය,** අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය

ගරු **(මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා,** රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ක්‍රිෂාන්ත අබේසේන මහතා,** විද්‍යා හා තාක්ෂණ අමාත්‍යතුමා

ගරු **අනුර කරුණාතිලක මහතා,** නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යතුමා

ගරු **කේ.ඩී. ලාල් කාන්ත මහතා,** කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා

ගරු **සුනිල් කුමාර ගමගේ මහතා,** තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා

ගරු **රාමලිංගම් චන්ද්‍රසේකර් මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යතුමා

ගරු **කුමාර ජයකොඩි මහතා,** බලශක්ති අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා,** සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **(ආචාර්ය) අනිල් ජයන්ත මහතා,** කම්කරු අමාත්‍යතුමා සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා,** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) උපාලි පන්නිලගේ මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යතුමා

ගරු **සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය,** කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යතුමිය

ගරු **බිමල් රත්නායක මහතා,** ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **ආනන්ද විජේපාල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා

ගරු **කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා

ගරු **වසන්ත සමරසිංහ මහතා,** වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සුනිල් හඳුන්නෙත්ති මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා

ගරු **සජිත් ප්‍රේමදාස මහතා,** පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු **චතුරංග අබේසිංහ මහතා,** කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නාමල් කරුණාරත්න මහතා,** කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජනිත රුවන් කොඩිතුවක්කු මහතා,** වරාය සහ සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රත්න ගමගේ මහතා,** ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග ගුණසේකර මහතා,** තරුණ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) ප්‍රසන්න ගුණසේන මහතා,** ප්‍රවාහන සහ මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඇන්ටන් ජයකොඩි මහතා,** පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ආර්.එම්. ජයවර්ධන මහතා,** වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මහින්ද ජයසිංහ මහතා,** කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා,** ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුගත් තිලකරත්න මහතා,** ක්‍රීඩා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගමගෙදර දිසානායක මහතා,** බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **වසන්ත පියතිස්ස මහතා,** ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුන්දරලිංගම් ප්‍රදීප් මහතා,** වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **මුනීර් මුලාෆර් මහතා,** ජාතික ඒකාබද්ධතා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) රුවන් රණසිංහ මහතා,** සංචාරක නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුසිල් රණසිංහ මහතා,** ඉඩම් සහ වාරිමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නීතිඥ සුනිල් වටගල මහතා,** මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **එරංග වීරරත්න මහතා,** ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **උපාලි සමරසිංහ මහතා,** සමූපකාර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ටී. බී. සරත් මහතා,** නිවාස නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා,** කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **පී. රුවන් සෙනරත් මහතා,** පළාත් සභා සහ පළාත් පාලන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන් හේමචන්ද්‍ර මහතා,** විදේශ කටයුතු සහ විදේශ රැකියා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නලින් හේවගේ මහතා,** වෘත්තීය අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **රොෂාන් අක්මීමන මහතා**

ගරු **අජිත් අගලකඩ මහතා**

ගරු **අම්ර්තනාදන් අඩෛක්කලනාදන් මහතා**

ගරු **අබූබකර් අතම්බාවා මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **රෝහිත අබේගුණවර්ධන මහතා**

ගරු **නීතිඥ යූ.පී. අබේවික්‍රම මහතා**

ගරු **(මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා**

ගරු **(වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා**

ගරු **(වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**

ගරු **ජේ.සී. අලවතුවල මහතා**

ගරු **එම්.කේ.එම්. අස්ලම් මහතා**

ගරු **ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා**

ගරු **මංජුල සුරවීර ආරච්චි මහතා**

ගරු **(ආචාර්ය) කෞෂල්‍යා ආරියරත්න මෙනෙවිය**

ගරු **බී. ආරියවංශ මහතා**

ගරු **(වෛද්‍ය) නජිත් ඉන්දික මහතා**

ගරු **අර්කම් ඉල්යාස් මහතා**

ගරු **එම්.එස්. උදුමාලෙබ්බේ මහතා**

ගරු **ගයන්ත කරුණාතිලක මහතා**

ගරු **රවී කරුණානායක මහතා**

ගරු **ක්‍රිෂ්නන් කලෛයිචෙල්වි මෙනෙවිය**

ගරු **ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**

ගරු **උපුල් කිත්සිරි මහතා**

ගරු **නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය**

ගරු **කදිරවේලු ෂන්මුගම් කුගදාසන් මහතා**

ගරු **වසන්ත පුෂ්ප කුමාර මහතා**

ගරු **චමින්ද ලලිත් කුමාර මහතා**

ගරු නීතිඥ සරත් කුමාර මහතා

ගරු නීතිඥ නිලන්ති කොට්ටහච්චි මහත්මිය

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා

ගරු මනෝ ගනේෂන් මහතා

ගරු ලසිත් භාෂණ ගමගේ මහතා

ගරු තිලංක යූ. ගමගේ මහතා

ගරු අජන්ත ගම්මැද්දෙගේ මහතා

ගරු චතුර ගලප්පත්ති මහතා

ගරු නිහාල් ගලප්පත්ති මහතා

ගරු අජිත් ගිහාන් මහතා

ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා

ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය

ගරු අශෝක ගුණසේන මහතා

ගරු ඩී. වී. චානක මහතා

ගරු රුවන්තිලක ජයකොඩි මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු නීතිඥ අනුරාධ ජයරත්න මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය

ගරු ටී.කේ. ජයසුන්දර මහතා

ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා

ගරු රජීවන් ජෙයචන්ද්‍රමූර්ති මහතා

ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා

ගරු නීතිඥ අනුෂ්කා තිලකරත්න මහත්මිය

ගරු චන්දන තෙන්නකෝන් මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු පලනි දිගම්බරම් මහතා

ගරු ධර්මප්‍රිය දිසානායක මහතා

ගරු සුජීව දිසානායක මහතා

ගරු නීතිඥ සුසන්ත දොඩාවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා

ගරු (මහාචාර්ය) සේන නානායක්කාර මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු නන්දන පත්මකුමාර මහතා

ගරු අරුණ පනාගොඩ මහතා

ගරු නිමල් පලිහේන මහතා

ගරු නිශාන්ත පෙරේරා මහතා

ගරු අජිත් පී. පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා

ගරු නීතිඥ චිත්‍රාල් ප්‍රනාන්දු මහතා

ගරු ස්ටෙෆනි ප්‍රනාන්දු මහතා

ගරු කන්දසාමි ප්‍රභු මහතා

ගරු අමිල ප්‍රසාද් මහතා

ගරු ලාල් ප්‍රේමනාත් මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු නන්ද බණ්ඩාර මහතා

ගරු පද්මසිරි බණ්ඩාර මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් බලගල්ල මහතා

ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා

ගරු ඊ.එම්. බස්නායක මහතා

ගරු විජේසිරි බස්නායක මහතා

ගරු සුනිල් බියන්විල මහතා

ගරු (වෛද්‍ය) සඳරුවන් මදරසිංහ මහතා

ගරු ලුතිනන් කොමාණ්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා

ගරු ජගත් මනුවර්ණ මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු රුවන් මාපලගම මහතා

ගරු (ආචාර්ය) නන්දන මිල්ලගල මහතා

ගරු සංජීව රණසිංහ මහතා

ගරු ආර්.එම්. සමන්ත රණසිංහ මහතා

ගරු සුනිල් රත්නසිරි මහතා

ගරු ආර්.එම්. ගාමිණී රත්නායක මහතා

ගරු මංජුල සුගත් රත්නායක මහතා

ගරු සුරංග රත්නායක මහතා

ගරු ඒ.එම්.එම්.එම්. රත්වත්තේ මහත්මිය

ගරු අසෝක සපුමල් රන්වල මහතා

ගරු තුරෛරාසා රවිකරන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා

ගරු මනෝජ් රාජපක්ෂ මහතා

ගරු සුනිල් රාජපක්‍ෂ මහතා

ගරු (ආචාර්ය) වී.එස්. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු නීතිඥ හසාරා ලියනගේ මහත්මිය

ගරු දීප්ති වාසලගේ මහත්මිය

ගරු එම්.එස්. අබ්දුල් වාහිද් මහතා

ගරු කංචන වැලිපිටිය මහතා

ගරු ආර්.ජී. විජේරත්න මහතා

ගරු නීතිඥ ප්‍රියන්ත විජේරත්න මහතා

ගරු රුවන් විජේවීර මහතා

ගරු නීතිඥ හිරුනි විජේසිංහ මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ජගත් විතාන මහතා

ගරු දිලිප් වෙදආරච්චි මහතා

ගරු අතුල වෙළඳගොඩ මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු ෆස්මින් ෂරීෆ් මහතා

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**

**ගරු තිළිණ සමරකෝන් මහතා**

**ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා**

**ගරු අම්බිකා සාමිවෙල් මෙනෙවිය**

**ගරු (වෛද්‍ය) ඉලෙයියතම්බි සිරිනාත් මහතා**

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**

**ගරු දේවානන්ද සුරවීර මහතා**

**ගරු චන්දන සූරියආරච්චි මහතා**

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඩී. සූරියබණ්ඩාර මහතා**

**ගරු අරවින්ද සෙනරත් මහතා**

**ගරු කිට්නන් සෙල්වරාජ් මහතා**

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**

**ගරු කබීර් හෂීම් මහතා**

**ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා**

**ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා**

**ගරු චම්පික හෙට්ටිආරච්චි මහතා**

**ගරු දිනිඳු සමන් හෙන්නායක මහතා**

**ගරු නීතිඥ ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය**

**ගරු දිනේෂ් හේමන්ත මහතා**

**ගරු නීතිඥ ගීතා හේරත් මහත්මිය**

**ගරු නීතිඥ භාග්‍ය ශ්‍රී හේරත් මහතා**

**ගරු මුහම්මද් ෆයිසාල් මහතා**

**ගරු රියාස් ෆාරුක් මහතා**

කුෂානි රෝහණදීර මහත්මිය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

චමින්ද කුලරත්න මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

හංස අබේරත්න මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස් විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. අභිනව මන්ත්‍රීවරයන්ගේ නිල ප්‍රතිඥාව හෝ දිවුරුම:** ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මුහම්මදු සරිපු අබ්දුල් වාහිද් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥා දී සභා මේසය මත තබා ඇති පොතෙහි අත්සන් කළේ ය.

**2. ජනාධිපතිවරයාගෙන් ලද සංදේශ: කථානායකවරයා විසින් මතු පළවන ජනාධිපතිවරයාගෙන් ලද සංදේශය කියවන ලදී :—**

**ශ්‍රී ලංකා ජනාධිපති**
**இலங்கை சனாதிபதி**
**President of Sri Lanka**

මගේ අංකය : පීඑස්/සීඑස්ඒ/00/7/IX/3/01

2025 ජුනි මස 26 .වන දින

**ගරු අයි.ඩබ්ලිව්.එම්. ජගත් වික්‍රමරත්න මැතිතුමා**
කථානායක
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ගරු කථානායකතුමනි,

**(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනත**

(40 වැනි අධිකාරය වූ) මහජන ආරක්ෂක ආඥා පනතේ 12 වැනි වගන්තියෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව, මහජන සාමය පවත්වාගෙන යාම සඳහා වන අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, පළමුවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන සන්නද්ධ හමුදාවල සියළුම සාමාජිකයින් එහි දෙවැනි උපලේඛනයේ නිශ්චය කොට දැක්වෙන ප්‍රදේශවල මහජන සාමය පවත්වාගෙන යාම සඳහා කැඳවන බවට ආඥාවක් නිකුත් කොට ඇත.

ඒ අනුව, උක්ත ආඥා පනතේ 21(2) වගන්තිය සමග කියවිය යුතු 2(3) වගන්තිය ප්‍රකාරව ඒ බව පාර්ලිමේන්තුව වෙත මෙයින් දැනුම් දෙමි.

මෙයට - හිතවත්

අනුර කුමාර දිසානායක
ජනාධිපති

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**
**இலங்கைச் சனநாயக சோசலிசக் குடியரசு**
**Democratic Socialist Republic of Sri Lanka**

**3. ලිපිලේඛනාදිය පිළිගැන්වීම:** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2024 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ I කොටස ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2024 වර්ෂය සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(v) 2024 වර්ෂය සඳහා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vi) 2024 වර්ෂය සඳහා සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(vii) 2024 වර්ෂය සඳහා ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(viii) 2024 වර්ෂය සඳහා ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ix) 2024 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(x) 2024 වර්ෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(xi) 2024 වර්ෂය සඳහා නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(xii) 2024 වර්ෂය සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(xiii) 2024 වර්ෂය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා ආර්ථික සංවර්ධනය සහ අන්තර්ජාතික සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(3) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2024 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(iii) 2024 වර්ෂය සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව;

(iv) 2024 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(v) 2024 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(vi) 2024 වර්ෂය සඳහා ජනාධිපති කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(4) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ජනමාධ්‍ය අංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් 2018 අංක 2 දරන ප්‍රපාතන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනතේ 64, 65, 66, 69 සහ 70 වගන්ති සමඟ සහ 45(5) වගන්තිය සමඟ කියවිය යුතු 84 වගන්තිය යටතේ වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2025 මාර්තු 27 දිනැති අංක 2429/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර, එම නියෝග වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව සහ රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(7) නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යවරයා විසින් —

(i) 2023 වර්ෂය සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා යටිතල පහසුකම් සහ උපාය මාර්ගික සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(8) තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් —

(i) 2024 වර්ෂය සඳහා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2024 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ඉදිරිපත් කර, එම වාර්තා අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් 2024 වර්ෂය සඳහා ක්‍රිස්තියානි ආගමික කටයුතු දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කර, එම වාර්තාව අධ්‍යාපනය, ශ්‍රම බලකාය සහ මානව ප්‍රාග්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** (1) රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ රෙගුලාසි (2025 මැයි 19 දිනැති අංක 2437/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද) සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(2) සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති, ගරු (වෛද්‍ය) නිහාල් අබේසිංහ මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද —

(i) 2023 වර්ෂය සඳහා පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2022 හා 2023 වර්ෂ සඳහා ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ වාර්ෂික වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි නියෝග කරන ලදී.

(3) රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති, ගරු අරවින්ද සෙනරත් මහතා විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තැබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**5. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) උණවටුන, ගණහේන, අංක 350 දරන ස්ථානයෙහි පදිංචි කේ. ඩී. එච්. එස්. එස්. ද සිල්වා මහතාගෙන් ලැබුණු 2025.03.25 දිනැති පෙත්සම ගරු රත්න ගමගේ මහතා විසින් පිළිගන්වන ලදී.

(2) ගොකරුල්ල, ඉහලගම, ගොඩගම යන ලිපිනයෙහි පදිංචි එන්. පී. සමන්ත විජේසේකර මහතාගෙන් ලැබුණු 2025.02.17 දිනැති පෙත්සම ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) කොහුවල, විජයමංගලාරාම පාර, අංක 9/1 ඒ දරන ස්ථානයෙහි පදිංචි එච්. විමලසිරි කල්දේරා මහතාගෙන් ලැබුණු 2024.12.19 දිනැති පෙත්සම; සහ

(ii) කෝට්ටේ, මාදිවෙල, සිගේරා පාර, අංක 245/5 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. අනුර ශාන්ත මහතාගෙන් ලැබුණු 2024.12.18 දිනැති පෙත්සම

ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

(4) ගම්පොල, නයාපාන, නව නුගවෙල, අංක 126 දරන ස්ථානයෙහි පදිංචි ජේ. එම්. ඒ. ඩී. ජයසිංහ මහත්මියගෙන් ලැබුණු 2025.03.14 දිනැති පෙත්සම ගරු නීතිඥ යූ. පී. අබේවික්‍රම මහතා විසින් පිළිගන්වන ලදී.

(5) සෙවනගල, ඩංඩුම, ජනාවාස නිවාස සංකීර්ණය, G 3/7 දරන ස්ථානයෙහි පදිංචි දේව ජයසිරි මහතාගෙන් ලැබුණු 2025.03.02 දිනැති පෙත්සම ගරු උපුල් කිත්සිරි මහතා විසින් පිළිගන්වන ලදී.

(6) වාරියපොල, හලාවත පාර, අංක 272/4 දරන ස්ථානයෙහි පදිංචි ඊ. එම්. ඒ. ඒකනායක මහතාගෙන් ලැබුණු 2025.03.15 දිනැති පෙත්සම ගරු සුජීව දිසානායක මහතා විසින් පිළිගන්වන ලදී.

(7) ගොඩගම, හෝමාගම, බොරැල්ල පාර, සිතුමිණ මාවත, අංක 217/2 දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රසිරි වෙත්තසිංහ ලියනගේ මහතාගෙන් ලැබුණු 2025.03.08 දිනැති පෙත්සම ගරු අරුණ පනාගොඩ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) බෝයගනේ, ඉසුරු පෙදෙස, 3 වන පටුමග යන ලිපිනයෙහි පදිංචි ඩී. ආර්. වේරගල මහත්මියගෙන් සහ වෙනත් දෙදෙනෙකුගෙන් ලැබුණු 2025.03.07 දිනැති පෙත්සම;

(ii) හබුරුගල, තොටකනත්ත, ප්‍රගති මාවත, අංක 22 දරන ස්ථානයෙහි පදිංචි ඩී. එම්. සිරිවීර මහතාගෙන් ලැබුණු 2025.03.11 දිනැති පෙත්සම;

(iii) ඉඳුරුව, හෙට්ටිගොඩ, 'නුග සෙවන' යන ලිපිනයෙහි පදිංචි දමිතා හෙට්ටිගේ මහත්මියගෙන් ලැබුණු 2025.03.14 දිනැති පෙත්සම;

(iv) අමුගොඩ, දික්හේන, පොල්ගහගොඩැල්ල වත්ත යන ලිපිනයෙහි පදිංචි එච්. එච්. කුමුදු මහතාගෙන් ලැබුණු 2025.03.10 දිනැති පෙත්සම; සහ

(v) කහදූව, මිරිස්වත්ත, 'නිල්මිණි' යන ලිපිනයෙහි පදිංචි ආර්. යසරත්න විජේවන්ත ඩයස් මහතාගෙන් ලැබුණු 2025.03.02 දිනැති පෙත්සම

ගරු නිශාන්ත පෙරේරා මහතා විසින් පිළිගන්වන ලදී.

(9) පොළොන්නරුව, නව නගරය, වාරිමාර්ග පෙදෙස, අංක 1092 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. එන්. ප්‍රියංගනී මහත්මියගෙන් සහ වෙනත් අයෙකුගෙන් ලැබුණු 2025.01.25 දිනැති පෙත්සම ගරු පද්මසිරි බණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

30(10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**6. ජාතික විගණන (සංශෝධන):** අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් පිළිගැන්වූ පනත් කෙටුම්පත,— 2018 අංක 19 දරන ජාතික විගණන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

පනත් කෙටුම්පත 2025 ජූලි 22 අඟහරුවාදා දෙවැනිවර කියවිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

**7. ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි:** අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය වෙනුවෙන් කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ යෝජනාව,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 මැයි 19 දිනැති අංක 2437/04 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.06.17 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(පූ.භා. 11.23 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

(අ.භා. 1.00 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 2.40 ට ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මහතා මූලාසනාරූඪ විය.)

(අ.භා. 3.53 ට නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. කල් තැබීම (ආබාධිත ප්‍රජාව සඳහා නිර්බාධිත සමාජ ජීවිතයක්):** "මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය"යි ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන්, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරිය විසින්, පාර්ලිමේන්තුව කල් තබන ලදී.

ඊට අනුකූලව, පාර්ලිමේන්තුව 2025 ජූලි 09 බදාදා පූ. භා. 9.30 වනතෙක් කල් ගියේ ය.